# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1831/8 - 2013 ඔක්තෝබර් මස 08 වැනි අඟහරුවාදා - 2013.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දෙන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

වර්ෂ 2013 ක් වූ ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

2013 අංක 3 දරන මුදල් සමාගම් (ණය සාධන පත්‍ර) විධානය

1. මෙම විධානය 2013 අංක 3 දරන මුදල් සමාගම් (ණය සාධන පත්‍ර) විධානය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සෑම මුදල් සමාගමකටම මෙම විධානයෙහි දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ විය යුතු ය. *(හැඳින්වීම)*

2. 2.1 මෙම විධානය මුදල් ණයට ගැනීම සඳහා මුදල් සමාගම් විසින් නිකුත් කෙරෙන ණය සාධන පත්‍ර සම්බන්ධව අදාළ විය යුතුය. ණය සාධන පත්‍රයක් යන්නෙන් බැඳුම්කරයක්, ණයකරයක්, වාණිජ පත්‍රයක්, පොරොන්දු නෝට්ටුවක් හෝ අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ණය සාධන පත්‍රයක් අදහස් විය යුතුය. *(ණය සාධන පත්‍ර)*

   2.2 සෑම ණය සාධන පත්‍ර නිකුතුවක්ම මුදල් ප්‍රතිඥාවක් මත හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ප්‍රතිඥාවක් මත සිදු කළ යුතුය.

   2.3 මුදල් සමාගමකට මෙම විධානයේ, මුදල් සමාගම් (පොළී අනුපාත) විධානයේ සහ මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානයේ විධිවිධානවලට යටත්ව ණය සාධන පත්‍ර නිකුත් කරනු ලැබිය හැකිය.

3. ඕනෑම ණය සාධන පත්‍රයක් මුදා හැරීමේ කාලය එය නිකුත් කරනු ලැබූ දිනයේ සිට මාසයක කාලයකට නොඅඩු විය යුතු අතර, මාස හැටක කාලයක් නොඉක්මවිය යුතුය. *(ණය සාධන පත්‍ර කල්පිරීම)*

4. 4.1 වසරකින් හෝ ඊට අඩු කාලයකින් කල්පිරෙන ණය සාධන පත්‍ර නිකුත් කිරීමේ දී, *(අරමුදල් කල්පිරීම)*

   i. පුද්ගලික ස්ථාපනයක් හරහා සිදු කළ යුතුය.
   ii. එය රුපියල් මිලියනයකට (1,000,000/-) නොඅඩු වටිනාකමකින් යුක්ත විය යුතුය.


1A - G 018362 — 170 (2013/10)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4.2 වසරකට වැඩි කල් පිරීම් සහිත ණය සාධන පත්‍ර නිකුත් කිරීම්,

i. ශ්‍රී ලංකා සුරැකුම් සහ විනිමය කොමිසමේ ණය ලැයිස්තුගත කිරීමේ රීතීන්ට යටත්ව කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත කළ යුතුය.

ii. ණය සාධන පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම අධ්‍යක්ෂගේ ලිඛිත අනුමැතිය අයදුම් කොට ලබාගත යුතුය.

පොළී අනුපාතයන්/කූපන අනුපාතයන්/වට්ටම් අනුපාතයන්

5. මුදල් සමාගමක් විසින් නිකුත් කරනු ලැබූ ණය සාධන පත්‍ර සඳහා ගෙවනු ලබන උපරිම වාර්ෂික පොළී/වට්ටම් /කූපන අනුපාතය මුදල් සමාගම් (පොළී අනුපාත) විධානයෙහි එන විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

ද්‍රවශීලතා අවශ්‍යතාව

6. සෑම මුදල් සමාගමක්ම මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානයේ ඇතුළත් විධිවිධානයන්ට යටත්ව ණය සාධන පත්‍ර සඳහා ද්‍රවශීලතාවය පවත්වා ගත යුතුය.

ණය සාධන පත්‍ර ආකෘතිය

7. 7.1 ඕනෑම අරමුණක් උදෙසා මුදල් ණයට ගන්නා සෑම මුදල් සමාගමක් විසින්ම ණය සාධන පත්‍රයන්හි ආයෝජනය කරනු ලබන සෑම පුද්ගලයෙකු වෙතම එම මුදල් සමාගම විසින් නියමිත මුදල් ප්‍රමාණය භාරගත් බවට දැනුම් දීමක් ලෙස ණය සාධන පත්‍රයක් නිකුත් කළ යුතුය.

7.2 එවැනි සෑම ණය සාධන පත්‍රයකම අවම වශයෙන් ණය සාධන පත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ නිලධාරීන් දෙදෙනෙකු විසින්වත් අත්සන් කරනු ලැබිය යුතුය.

7.3 සෑම ණය සාධන පත්‍රයකම පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය.

i. කාණ්ඩ අංකය ;
ii. මුදල් සමාගමේ නම සහ ලියාපදිංචි ලිපිනය ;
iii. නිකුත් කළ දිනය ;
iv. ආයෝජකයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය සහ ලිපිනය ;
v. භාරගත් මුදල් ප්‍රමාණය ඉලක්කමෙන් සහ අකුරින් ;
vi. ගෙවිය යුතු වාර්ෂික පොළී අනුපාතය සහ පොළිය ගෙවන ආකාරය ;
vii. ණය සාධන පත්‍රය කල් පිරෙන දිනය ;
viii. බලයලත් නිලධාරීන්ගේ නම් සහ තනතුරු.

ලේඛන පවත්වාගෙන යාම

8. 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පනවන ලද අවශ්‍යතා සහ ඊට අනුගාමී ඕනෑම නීතියකට අමතරව සෑම මුදල් සමාගමක්ම සෑම ණය සාධන පත්‍ර වර්ගයක්ම සඳහා පහත දැක්වෙන තොරතුරු ඇතුළත් වෙනම ලේඛනයක් පවත්වා ගත යුතුය.

i. කාණ්ඩ අංකය ;
ii. සෑම ආයෝජකයෙකුගේම නම, ලිපිනය, සම්බන්ධ කර ගැනීමේ තොරතුරු, ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත් අංකය ; නැතහොත් ආයෝජක ආයතන සම්බන්ධයෙන් වන විට නම, ලියාපදිංචි ලිපිනය, ව්‍යාපාර කටයුතු සිදු කරන මූලස්ථානය, සමාගම් ලියාපදිංචි අංකය ;
iii. භාරගත් මුදල් ප්‍රමාණය ;
iv. ණය සාධන පත්‍රය කල් පිරෙන දිනය ;
v. පොළී අනුපාතයන් සහ පොළිය ගෙවනු ලබන ආකාරය (මාසික/කාර්තුමය/අර්ධ වාර්ෂික/වාර්ෂික හෝ කල් පිරීමේදී ) ; සහ
vi. සෑම ගෙවීමකම දිනය සහ මුදල් ප්‍රමාණය (පොළිය සහ/හෝ මුල් මුදල).

වසරකට වැඩි කල් පිරීම් කාලයක් සහිත ණය සාධන පත්‍ර සඳහා අවශ්‍ය දැන්වීම් සහ වෙනත් අවශ්‍යතා

9. 9.1 මහජනතාව වෙතින් සෘජුව හෝ වක්‍රව ණය ලබා ගැනීමේ අරමුණින් මුදල් සමාගමක් විසින් පළ කරනු ලබන සෑම දැන්වීමකම :–

i. එම සමාගම 2011 අංක 42 දරන මුදල් සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර ලබා දුන් සමාගමක් බව ;
ii. සමාගම පිහිටුවනු ලැබූ දිනය ;
iii. සමාගමේ ණය වර්ගීකරණය සහ ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි ණය වර්ගීකරණ නියෝජිතායතනයක් විසින් පවරනු ලැබූ ණය සාධන පත්‍රය ;
iv. පොළිය ගෙවීමේ කාලසීමාවන්, වාර්ෂික කූපන අනුපාතය සහ එවැනි ණයවල කල් පිරීම් ; සහ
v. කවරාකාර ණය පිළිගැනේද යන්නට යටත්ව නියමයන් සහ කොන්දේසි.

9.2 මෙම වගන්තිය යටතේ දැක්වෙන පරිදි මුදල් සමාගමක් විසින් දැන්වීම් පළ කිරීමේදී අනෙකුත් මූල්‍ය ආයතන සමඟ අසාධාරණ සහ ආචාර ධර්මයන්ට පටහැනි වන තරඟකාරී බවකට හේතු වන ආකාරයේ කිසිදු යෙදුමක් භාවිතා නොකළ යුතුය. මෙම වගන්තිය යටතේ පළ කරනු ලැබූ/විකාශය කරනු ලැබූ/ප්‍රචාරය කරනු ලැබූ/ප්‍රදර්ශණය කරනු ලැබූ යම් දැන්වීමක් මෙම වගන්තියේ විධිවිධානයන්ට අනුකූල නොවන බව හෝ මහජනතාව නොමඟ යවන සුළු කරුණුවලින් සමන්විත බව හෝ අධ්‍යක්ෂගේ මතය වන විට අධ්‍යක්ෂ විසින් දක්වනු ලබන ආකාරයට සාධාරණ කාලයක් තුළ එම දැන්වීම සංශෝධනය කොට පළ කරන/විකාශය කරන/ප්‍රචාරය කරන/ප්‍රදර්ශනය කරන ලෙස අධ්‍යක්ෂ විසින් අදාළ මුදල් සමාගමට නියම කරනු ලැබිය හැකිය.

9.3 ණය නිකුතුවකට දායකයින් සපයා ගැනීම සඳහා වන ඕනෑම දැන්වීමක් පළ කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට පෙර මුදල් සමාගමක් විසින් අධ්‍යක්ෂ වෙතින් අයදුම් කරනු ලැබ ඒ සඳහා ලිඛිත අනුමැතියක් ලබාගත යුතුය. එවැනි දැන්වීමක් පළ කිරීමට/ප්‍රදර්ශනය කිරීමට අවම වශයෙන් වැඩ කරන දින 3 කට පෙර මුදල් සමාගමක් විසින් එම දැන්වීමේ මුද්‍රිත හෝ විද්‍යුත් පිටපතක් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

10. මෙම විධානයෙහි අර්ථ නිරූපනය

(i) "අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙන් මුදල් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ.

(ii) "අධ්‍යක්ෂ" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේ - න්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

(iii) "මූල්‍ය ආයතනය" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලැබූ බැංකුවක් හෝ 2011 අංක 42 දරන මුදල් සමාගම් පනත යටතේ බලපත්‍ර ලැබූ මුදල් සමාගමක් හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ සමාගමක් අදහස් වේ.

(iv) "පුද්ගලික ස්ථාපනයක්" යන්නෙන් අන්තර්ජාල, තැපැල්, ෆැක්ස්, විද්‍යුත් තැපෑල, අත් පත්‍රිකා, බැනර්, පෝස්ටර් හෝ පොත් ඇතුළු කිසිදු මාධ්‍යකින් දැන්වීම් පළ කිරීමක් හෝ අරමුණු ඉදිරිපත් කිරීමකින් තොරව කිසිදු ලෙසකින් කවරාකාර හෝ ප්‍රචාරයක් සිදු නොකර කරනු ලබන ණය සාධන පත්‍ර නිකුතුවක් අදහස් වේ.

10 - 674

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.